*සැ. යු.* - 2018.09.07 දින පළ වූ අංක 2,088 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,089 - 2018 සැප්තැම්බර් මස 14 වැනි සිකුරාදා - 2018.09.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1386 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1391 |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1404 |

සැ. යු. - රසායනික අවි සම්මුතිය පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත 2018 සැප්තැම්බර් මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ඔක්තෝබර් මස 05 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 සැප්තැම්බර් 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### කැස්බෑව නගර සභාව

කැස්බෑව නගර සභාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරුවලට ස්ථිර පදනම මත බඳවා ගැනීම සඳහා පහත සඳහන් නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | රියදුරු III ශ්‍රේණිය | 02 | රු. 25,790 - 10x270 – 10x300 – 10x330 – 12x350 – රු. 38,990/- (රා.ප.ච. 3/2016 වැටුප් පරිවර්තන වගුව අනුව PL 3-2016 වැටුප් පරිමාණයේ උපලේඛන අංක II අනුව I පියවර වන රු. 20,462/- ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ. (III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි ) | **අධ්‍යාපන සුදුසුකම් :**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/ දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. (එක් වරකදී විෂයයන් පහක් (05) අවම වශයෙන් සමත්ව තිබිය යුතුය.)<br>**වෘත්තීය සුදුසුකම් :**<br>1. තාර බර හොණ්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම්, 'ඒ1' සහ 'සී1' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' සහ 'ඩී1' පන්තියේ බලපත්‍රයක් නැතහොත් තාර බර හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ 'ඒ' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'ඩී' පන්තියේ බලපත්‍රයක් තිබිය යුතුය.<br>2. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.<br>**පළපුරුද්ද :**<br>3. බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| 02 | යන්ත්‍ර ක්‍රියාකරු II ශ්‍රේණිය | 01 | රු. 25,790 - 10x270 – 10x300 – 10x330 – 12x350 – රු. 38,990/- (රා.ප.ච. 3/2016 වැටුප් පරිවර්තන වගුව අනුව PL 3-2016 වැටුප් පරිමාණයේ උපලේඛන අංක II අනුව I පියවර වන රු. 20,462/- ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ. (III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | **අධ්‍යාපන සුදුසුකම් :**<br>අවම වශයෙන් 8 වන ශ්‍රේණිය / 9 වසර සමත් වී තිබීම.<br>**වෘත්තීය සුදුසුකම් :**<br>1. තාර බර හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් හා මගීන් 32 ට වඩා ගෙන යාමට බලපත්‍ර ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනතාව පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය.<br>2. අවම උස අඩි 5 අඟල් 6 ක් විය යුතුය.<br>3. බර යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳව රජයේ හෝ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ප්‍රවීණතාවයක් ලබා තිබීම. (පිළිගත් ආයතන වශයෙන් රජයේ ආයතනයක්, පළාත් රාජ්‍ය ආයතනයක් හෝ රජයේ ලියාපදිංචි පුද්ගලික ආයතනයක් හැඳින්වේ.)<br>4. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික අවබෝධයක් තිබිය යුතුය. |

*අංක 1 හා 2 තනතුරට බඳවාගැනීමේ ක්‍රමය* :- ලේකම් විසින් පත්කරනු ලබන විධායක/ මාණ්ඩලික නිලධාරියෙකු, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරීක්ෂකවරයෙකු හා පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ පරීක්ෂණයෙන් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකින් සමත් විය යුතුය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 03 | කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය | 02 | රු. 24,250 - 10x250 - 10x270 – 10x300 – 12x330 - රු.36,410/- (රා.ප.ච. 3/2016 වැටුප් පරිවර්තන වගුව අනුව PL 1-2016 වැටුප් පරිමාණයේ උපලේඛන අංක II අනුව I පියවර වන රු. 19,242/- ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ. (III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි ) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය.) |
| 04 | මුරකරු III ශ්‍රේණිය | 01 | රු. 24,250 - 10x250- 10x270 – 10x300 – 12x330 - රු.36,410/- (රා.ප.ච. 3/2016 වැටුප් පරිවර්තන වගුව අනුව PL 1-2016 වැටුප් පරිමාණයේ උපලේඛන අංක II අනුව I පියවර වන රු. 19,242/- ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ. (III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි ) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහක් (05) ක් එකවර සමත් විය යුතුය.) |
| 05 | සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 01 | රු. 24,250 - 10x250- 10x270 – 10x300 – 12x330 - රු. 36,410/- (රා.ප.ච. 3/2016 වැටුප් පරිවර්තන වගුව අනුව PL 1-2016 වැටුප් පරිමාණයේ උපලේඛන අංක II අනුව I පියවර වන රු. 19,242/- ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ. (III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි ) | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. |

**අංක 3 සිට 5 දක්වා තනතුරුවලට බඳවා ගැනීමේ ක්‍රමයඃ-**
**සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම ප්‍රථිඵල අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.**

02. *බඳවා ගැනීම සඳහා වූ පොදු කොන්දේසි :*

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාල නොවේ.
4. අයදුම්කරුවන් ඒ ඒ තනතුරු ඉදිරියේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.
5. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 3 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචියක් තිබිය යුතුය.
6. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේක අංක 44/ 90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.
7. මෙම තනතුරු සඳහා තෝරාගනු ලැබුවහොත් මසක් ඇතුළත නියමිත සුදුසුකම් ලත් රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. බඳවාගනු ලබන සේවකයින් වැන්දඹු / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
2. පත්වීමේ දින සිට වසර 03 ක පරිවාස කාලයකට යටත් වන අතර උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයකට යටත්වේ.
3. මෙම බඳවාගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලටද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝග වලටද, බස්නාහිර පළාත් සභාව හෝ පළාත් පාලන කොමසාරිස් හා කැස්බෑව නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට සියලු සේවකයින් බැඳී සිටිය යුතු ය.

04. *අයදුම්කළ යුතු ආකාරය :*

*(අ)* මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි A4 ප්‍රමාණයේ කඩදාසි වල අයදුම්පත් සකස් කර ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම පස ඉහළ කෙළවරෙහි සඳහන් කර 2018.10.05 දිනට පෙර ලේකම්, කැස්බෑව නගර සභාව, පිළියන්දල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

*(ආ)* දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතනික ප්‍රධානියාගේ නිර්දේශය සහිතව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

*(ඇ)* නියමිත දින පසුවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල, සහතිකවල පිටපත් එවිය යුතුවේ. සම්මුඛ පරීක්ෂණයේදී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය,

(ii) අධ්‍යාපන සහතික,

(iii) අදාළ කාලසීමාව සඳහා පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය,

(iv) මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්,

(v) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,

(vi) වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික

06. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී, බස්නාහිර පළාතේ මෙම තනතුරු වලට අදාළ නව බඳවාගැනීමේ පටිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය කැස්බෑව නගර සභාවේ ලේකම් සතුය.

කේ. ටී. ගම්ලත්,
ලේකම් (වැ.බ.),
කැස්බෑව නගර සභාව.

2018 සැප්තැම්බර් මස 03 වැනි දින,
කැස්බෑව නගර සභාව,
පිළියන්දල.

## ආදර්ශ අයදුම්පත්‍රය

*කැස්බෑව නගර සභාවේ ........................................................................ තනතුරට බඳවාගැනීම සඳහා අයදුම් පත්‍රය*

01. (අ) මුලකුරු සමග නම :——————————————.

02. (ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————.

03. (අ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————.

(ආ) ස්ථිර පදිංචි ලිපිනය :——————————————.

04. දුරකථන අංකය : පෞද්ගලික :—————— නිවස :——————

05. ස්ත්‍රී / පුරුෂ භාවය :——————————————.

06. (අ) උපන් දිනය :- අවුරුද්ද :—————— මාසය :—————— දිනය :——————

(ආ) අයදුම්පත් භාරගන්නා දිනට වයස : අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

07. හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

08. විවාහක / අවිවාහක බව :——————————————.

09. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචියෙන් ද? යන වග :——————————

10. අධ්‍යාපන සුදුසුකම් :——————————————.

11. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කර තිබේ ද? එසේ නම් විස්තර :——————————

12. වෘත්තීමය සුදුසුකම් හා පළපුරුද්ද :——————————————.

13. ඔබ දැනට නගර සභාවෙහි සේවය කරන්නේ නම් :

1. දැනට දරන තනතුර :——————————————.
2. එම තනතුරට පත් වූ දිනය :——————————————.
3. එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/ දෛනික / තාවකාලික / ව්‍යාපෘති පදනම ද යන වග) :——————————

14. වෙනත් සුදුසුකම් : ——————————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවාගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බව ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

..............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : ..........................

ආයතන ප්‍රධානියාගේ සහතිකය

*(රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා)*

මෙම ඉල්ලුම්කරු වන ............................................................................... මහතා / මහත්මිය / මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ............................................................................... වශයෙන් සේවයේ යෙදේ. ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැක / නොහැක. ඔහු / ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි. / නොකරමි.

...............................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :——————————.
පදවිය:——————————.
දෙපාර්තමේන්තුව / ආයතනය :——————————.
(නිල මුද්‍රාව)
දිනය :——————————.

09 - 461

---

සංශෝධනයයි

**අක්මීමන ප්‍රාදේශීය සභාව**

2018.07.20 දින පළ කරන ලද අංක 2081 දරන ගැසට් පත්‍රයේ 07-497 නිවේදනයේ 04 බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි ෑ

04.1. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය. වැන්දඹු පුරුෂ/අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.. ලෙස පළ වී ඇත.

එය -

04.1 මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය. වැන්දඹු පුරුෂ/අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

ලෙස සංශෝධනය විය යුතුය.

බී. ජී. බන්දුල,
ලේකම්,
අක්මීමන ප්‍රාදේශීය සභාව.

2018 අගෝස්තු මස 17 වැනි දින,
අක්මීමන ප්‍රාදේශීය සභාවේ දී ය.

09-227

---

**හක්මන ප්‍රාදේශීය සභාව**

තනතුරු ඇබෑර්තු සඳහා දින දීර්ඝ කිරීම

හක්මන ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති ආදාහනාගාර සහායක තනතුර සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය 2018.07.20 දින අංක 2,081 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ (IV ආ) කොටස - පළාත් පාලනය තනතුරු ඇබෑර්තු හි පළ වූ නිවේදනයේ සඳහන්ව ඇති පරිදි අයදුම්පත් යොමු කිරීමේ අවසාන දිනය 2018.09.21 දින දක්වා දීර්ඝ කර ඇති බව මෙයින් නිවේදනය කරමි. මීට අදාළ අනෙකුත් සියලු කොන්දේසි ඉහත ගැසට් පත්‍රයට අනුකූල වන බව දන්වා සිටිමි.

වී. පී. කේ. අනුරාධ ප්‍රේමරත්න,
සභාපති,
හක්මන ප්‍රාදේශීය සභාව.

09-330

# පළාත් පාලන නිවේදන

## ඇඹිලිපිටිය නගර සභාව

### අතුරු ව්‍යවස්ථා

255 වන අධිකාරි බලය යටතේ පවතින නගර සභා ආඥාපනතේ 153 හා 154 වන වගන්ති වලින් පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ ඇඹිලිපිටිය නගර සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව, නගර සභා ආඥා පනතේ 154 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ ආණ්ඩුකාරවර වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නිලූකා ඒකනායක,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

වර්ෂ 2018 අගෝස්තු මස 16 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

**ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශය තුළ මාර්ගවල හා පල්ලේගම බස් නැවතුම්පළ භූමිය තුළ රථ වාහන නතර කිරීම හා වාහන හැසිරවීම විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශයේ මාර්ගවල හා පල්ලේගම බස් නැවතුම්පල භූමිය තුළ රථ වාහන නතර කිරීම හා රථ වාහන හැසිරවීම විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. නගර සභා බල ප්‍රදේශයේ මාර්ගවල හා බස් නැවතුම්පළ භූමිය තුළ රථ වාහන නතර කිරීම හා රථ වාහන හැසිරවීම විධිමත්ව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාම හා මඟී ආරක්ෂාව හා රථ වාහන අනතුරු වළක්වා ගැනීම උදෙසා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙහි මින්මතු සභාපතිවරයා වශයෙන් හඳුන්වනු ලබන, නගර සභාවේ සභාපතිවරයා විසින් බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම හෝ වාහන නතර කර තැබීම තහනම් කරන හෝ සීමා කරන *නැතහොත්* පාලනය කරන යම් වීථියක, වීථියක කොටසක හෝ මාර්ගයක කවර වූ හෝ කොටසක වාහන නතර කිරීම සඳහා වෙන්කර ඇති, වාහන නතර කිරීමේ ස්ථානයක් බව සඳහන් කරන දැන්වීමක් ඒ වීථියෙහි *නැතහොත්* වීථියක කොටසක හෝ මාර්ගයක කවර වූ හෝ කොටසක ප්‍රකට ස්ථානයක සිට පෙනී යන ආකාරයට ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

4. (*අ*) නගර සභා ප්‍රදේශයේ කිසියම් වීථියක හෝ මාර්ගයක කවර වූ හෝ කොටසක හා බස් නැවතුම්පළ භූමිය තුළ,
   i. රථ වාහන නවතා තැබීම තහනම් කිරීම ;
   ii. සීමා කිරීම;
   iii. එක් පැත්තක පමණක් වාහන නවතා තැබීමට ඉඩ දීම;
   iv. බඩු බෑම හෝ පැටවීම තහනම් කිරීම හෝ සීමා කිරීම;
   v. මඟීන් බැස්සවීම හෝ නැග්ගවීම තහනම් කිරීම;
   vi. බස්නැවතුම් ස්ථාන නම් කිරීම;
   vii. තනි අතට පමණක් වාහන ධාවනය කරන වීථි හෝ මාර්ග නම් කර ගමන් කළ හැකි දිසාව තීරණය කිරීම;

   සඳහා නගර සභාවට බලය තිබිය යුතු ය.

   (*ආ*) නගර සභාව විසින් (අ) ඡේදය යටතේ වන කිසියම් සීමා කිරීමක් කරනු ලැබීමෙන් අනතුරුව එකී සීමා කිරීම පිළිබඳ මාර්ග සංඥා අදාළ ස්ථානයේ සවිකිරීමට සැළැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය. එකී සීමා කිරීම පිළිබඳ මාර්ග සංඥා, මෝටර් වාහන පනතේ 164 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1987 මාර්තු මස 13 වැනි දිනැති අංක 444/18 දරන I වන කොටස (I) වන ඡේදය *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති නියෝගවලට අනුව විය යුතුවාත් හැර එකී නියෝගවලට කලින් කල කරනු ලබන සංශෝධනයන්ට යටත් විය යුතු ය.

5. නගර සභා බල ප්‍රදේශය ඇතුළත හෝ නගර සභා බල ප්‍රදේශය හරහා වැටී ඇති කිසියම් වීථියක හෝ මාර්ගයක ධාවනය කරන ඕනෑම වාහනයක රියදුරෙකු විසින් 4 වන අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ නියමයන් යටතේ සවිකරනු ලැබ ඇති මාර්ග සංඥාවලින් නිරූපණය කෙරෙන නියමයන් පිළිපැදීම කරනු ලැබිය යුතු ය.

6. 5 වන අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද 3 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ නගර සභාව විසින් තීරණය කරනු ලැබ සවිකරනු ලැබූ කිසියම් මාර්ග සංඥාවක් මගින් නියම කරනු ලැබ ඇති සීමාවන් -

(අ) එකී වීථියේ හෝ මාර්ගයේ කිසියම් කොටසක හෝ නගර සභා ප්‍රදේශය තුළ වෙනත් කවර හෝ වීථියක හෝ මාර්ග යක ආසන්නයේ ඇති කිසියම් ගොඩනැගිල්ලක හෝ ඒ ආසන්නයේ ඇතිවන යම් ගින්නක් හෝ වෙනත් යම් ආපදාවක් මැඩ පැවැත්වීමේ කාර්යය සඳහා යොදාගන්නා නගර සභාවේ ගිනි නිවන රථයක් හෝ වෙනත් කවර වූ හෝ වාහනයක් සඳහා;

(ආ) එකී වීථියේ හෝ මාර්ගයේ කිසියම් කොටසක හෝ නගර සභා ප්‍රදේශය තුළ වෙනත් කවර හෝ වීථියක හෝ මාර්ගයක ඇතිවන වාහන තදබදයක් මගහැරවීම සඳහා හෝ නගර සභා ප්‍රදේශය ඇතුළත ඇතිවන වෙනත් කිසියම් අනපේක්ෂිත තත්ත්වයක් පාලනය කිරීම සඳහා යම් පොලිස් නිලධාරියෙකු විසින් අවස්ථාවෝචිත පරිදි කරනු ලබන විධානයක් අනුව ක්‍රියා කිරීම සඳහා;

එකී 5 වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කිරීමක් ලෙස සැලකීම නොකළ යුතු ය.

7. (අ) නගර සභා ප්‍රදේශය තුළ මෙහි මින්මතු "රථ ගාල" යනුවෙන් හඳුන්වනු ලබන මෝටර් වාහන නවතා තැබීමේ කාර්යය සඳහා -

i. නගර සභාව සතු කිසියම් ඉඩමක්; හෝ
ii. වෙනත් කිසියම් අධිකාරයක් සමග ඇති කරගනු ලබන ගිවිසුමක් අනුව එකී අධිකාරය සතු කිසියම් ඉඩමක්; හෝ

වෙන් කිරීමට නගර සභාවට බලය තිබිය යුතු ය.

(ආ) නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් රථ ගාලක නවතා තැබිය හැකි වාහන වර්ගය හා එකවර නවතා තැබිය හැකි උපරිම වාහන සංඛ්‍යාව කොපමණ ද යන්න කලින් කල තීරණය කිරීම නගර සභාව විසින් කරනු ලැබිය හැකි ය.

8. නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන සෑම රථ ගාලකම අවම වශයෙන් වාහන ඇතුළු කිරීම සඳහා එක් දොරටුවක් සහ පිටවීම සඳහා එක් දොරටුවක් ද බැගින් දොරටු දෙකක් වෙන්කර තිබිය යුතු ය. එසේ වුව ද රථ ගාල ඇතුළත වාහන හැරවීම සඳහාම වෙන් වූ කොටසක් ඇති කර තබන්නේ නම් හා එකවර වාහන දෙකක් දෙපසට ගමන් කළ හැකි ද්වීත්ව ධාවන මං තීරු හා දොරටුවේ ඉඩකඩ සලස්වා ඇති අවස්ථාවක වාහන ඇතුළුවීම සහ පිටවීම සඳහා එක් දොරටුවක් පමණක් තිබීමට සැලැස්විය හැකි ය.

9. සෑම රථ ගාලකම නවතා තැබීමට පැමිණෙන වාහන ඇතුල් කිරීමේ දොරටුව හා පිටවීමේ දොරටුව පහසුවෙන් කියවීමට හැකිවන ආකාරයට භාෂාත්‍රයෙන් දැන්වීමක් සවිකර තිබිය යුතු අතර එකී ස්ථානය ඇතුළත වාහන නවතා තැබීමට පැමිණීමේදී සහ ඉන් පිටතට ගැනීමේ දී ධාවනය කළ යුතු දිසාව පහසුවෙන් හඳුනාගැනීමට හැකිවන ආකාරයෙන් සෙන්ටිමීටර් 20ක පළලින් යුතු සුදුපාට රේඛාවක් සහිත ඊතල සලකුණු කර තිබිය යුතු ය.

10. සෑම රථ ගාලකම බිම තාර දමා හෝ කොන්ක්‍රීට් දමා තිබිය යුතු අතර එකී රථ ගාල පරිහරණය කරන්නන්ගේ පාවිච්චිය සඳහා ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශවයටම වෙන් වෙන් වූ වැසිකිළි තනා තිබිය යුතු ය. එසේම ස්ථානය තුළ රැස්වන ජලය පහසුවෙන් ගලායාමට ප්‍රමාණවත් කාණු තනා තිබිය යුතු ය.

11. සෑම රථ ගාලක ම පරිශ්‍රය තුළ එකතු වන කසළ දිනපතා බැහැර කිරීමට සහ එකී ස්ථානයේ පවත්නා වැසිකිළි දිනපතා විෂබීජ නාශක යොදා පිරිසිදු කිරීමටත් සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

12. සෑම රථ ගාලක ම වාහන නවතා තැබීමට ඉඩකඩ වෙන් කිරීමේ දී රථ ගාල ඇතුළට පැමිණෙන සහ ඉන් පිටවන වාහනවලට ගමන් කිරීම සඳහා ප්‍රමාණවත් ධාවන මංතීරු ඇතිකර තිබිය යුතු ය.

13. කිසියම් වාහනයක් රථ ගාල ඇතුළත ධාවනය කිරීමේ දී හා ගාල් කිරීමේ දී, ඒ තුළ ගාල්කර ඇති වෙනත් යම් වාහනයකට බාධාවක් නොවන පරිදි එක් එක් වාහනය නවතා තැබීමට රථ ගාල ඇතුළත ප්‍රමාණවත් ඉඩකඩ වෙන්කර තිබිය යුතු අතර, එක් එක් වාහනය සඳහා වෙන්කර ඇති සීමාව පෙන්නුම් කෙරෙන සෙන්ටිමීටර් 10ක පළලින් යුතු සුදුපාට රේඛාවකින් සලකුණු කර තිබිය යුතු ය.

14. නගර සභාව සතු කිසියම් රථ ගාලක් ඇතුළත වාහන නවතා තැබීම වෙනුවෙන් නගර සභාව විසින් කලින් කළ තීරණය කරනු ලබන ආකාරයේ ගාස්තුවක් අයකළ හැකිය. එසේම කිසියම් රථ ගාලක නවතා තබන යම් වර්ගයක වාහනයක් නවතා තැබීම වෙනුවෙන් අයකිරීම නගර සභාව තීරණය කළ ගාස්තු ප්‍රමාණය එකී රථ ගාලේ ඇතුල්වීමේ දොරටුවේ ප්‍රකටව පෙනෙන පරිදි භාෂාත්‍රයෙන් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

15. (අ) කිසියම් රථ ගාලක නවතා තබන වාහනවලින් ගාස්තු අයකිරීම සඳහා මෙහි මින්මතු "රථ ගාල භාරකරු" යනුවෙන් හඳුන්වනු ලබන -

(i) නගර සභාවේ සේවයේ නියුක්ත කවර හෝ සේවකයෙකු; හෝ
(ii) නගර සභාව විසින් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මගින් තෝරාගනු ලැබූ කිසියම් සාර්ථක ටෙන්ඩර්කරුවකු හෝ එකී ටෙන්ඩර්කරු විසින් නම් කරනු ලැබූ ඔහුගේ අනුයෝජිතයෙකු;

යෙදවීම කළ හැකි ය.

(ආ) එසේ වුවද කිසියම් රථ ගාලක වාහන නවතා තැබීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තුව 14 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට නගර සභාව විසින් තීරණය කරනු ලැබූ ගාස්තුවේ ප්‍රමාණය නොඉක්මවිය යුතුවාත් හැර එක් එක් වාහනය නවතා තැබීම වෙනුවෙන් අයකළ ගාස්තු ප්‍රමාණය මේ කොටසේ පළමුවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරගත් කුවිතාන්සියක සටහන් කර වාහනයේ රියදුරා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

16. සෑම රථ ගාල් භාරකරුවෙකුම ඒ කාර්යයේ නියුක්ත වන කාලය ඇතුළත නගර සභාව විසින් තීරණය කරනු ලබන හා රථ ගාල භාරකරු පහසුවෙන් හඳුනාගැනීමට හැකිවන ආකාරයේ ඇඳුමකින් සැරසී සිටීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

17. (අ) 7 වන අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදය යටතේ නවතා තැබීමට ඉඩදෙනු ලැබීමට තීරණය කර ඇති කිසියම් වර්ගයක රථයක් නවතා තැබීමට රථ ගාලට ඇතුළු කරන අවස්ථාවේ දී එකී රථ ගාලේ ඇතුල්වීමේ දොරටුව ළඟදී එකී වාහනයේ රියදුරා වෙත මේ කොටසේ දෙවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ ඇතුල්වීමේ අවසරය දැක්වෙන ඇතුල් වීමේ අවසර කාඩ් පත්‍රයක් නිකුත් කිරීම රථ ගාල භාරකරුගේ කාර්යය විය යුතු ය.

(ආ) ඇතුල්වීමේ අවසර පත්‍රයක් සහිත සෑම වාහනයක්ම රථ ගාලෙන් පිටත්ව යාමට පෙර -

i. (අ) ඡේදයේ සඳහන් කාඩ් පත්‍රය රථ ගාල භාරකරුට අපසු භාර දීම;
ii. 14 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට නගර සභාව විසින් තීරණය කරනු ලැබූ ප්‍රමාණයන්ට ගැළපෙන වාහන නවතා තැබීමේ ගාස්තුව රථ ගාල භාරකරුට ගෙවීම; සහ
iii. ගෙවන ලද ගාස්තුවට ගැලපෙන 15 වන අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ සඳහන් කුවිතාන්සියක් ලබාගැනීම;

එකී වාහනයේ රියදුරාගේ කාර්යය විය යුතු ය.

18. (අ) කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් රථ ගාලක නවතා තැබීමට ඉඩ දීමට නගර සභාව තීරණය කර ඇති වර්ගයක වාහනයක් වන්නේ නම් මිස වෙනත් කවර වූ වාහනයක් හෝ මෝටර් වාහනයක් නොවන කවර වූ වාහනයක් රථ ගාලක නවතා තැබීම හෝ රථගාලකට ඇතුල් කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කරනු නොලැබිය යුතු ය.

(ආ) රථ ගාලක නවතා තිබෙන කිසියම් වාහනයක් එකී රථ ගාලෙන් ඉවතට ගැනීම සඳහා එකී වාහනය පනගැන්වීමට නොහැකි වන අවස්ථාවක දී, එකී වාහනය ඇදගෙන යාම සඳහා රථ ගාල තුළට පැමිණෙන කිසියම් වෙනත් යම් වාහනයක් එකී රථ ගාලට ඇතුල් කිරීමට ප්‍රමාණවත් ඉඩකඩක් ඇත්තේ නම් එසේ පැමිණෙන වෙනත් වාහනයකට (ආ) ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය. එසේ වුව ද එකී වාහනය ඇදගෙන යාමේදී රථ ගාලේ නවතා තිබෙන වෙනත් වාහනවලට කවර හෝ බාධාවක් හෝ හානියක් වන ආකාරයෙන් ඇදගෙන යාම නොකළ යුතු ය.

19. කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් රථගාලක ඇතුළත -

*(අ)* වාහන සේදීම හෝ එසේ කිරීමට සැලැස්වීම;

*(ආ)* යම් වාහනයක් ඉවත් කර ගැනීමේ කාර්යය සඳහා එකී වාහනය පණගැන්වීමට අත්‍යවශ්‍ය අලුත්වැඩියාවක් හෝ රෝදයක් මාරුකිරීමේ කාර්යයක් හෝ නොවන වෙනත් කවර හෝ අලුත්වැඩියාවක් කිරීම;

*(ඇ)* (ආ) ඡේදයේ සඳහන් කිසියම් අලුත්වැඩියා කිරීමක දී අවස්ථාවෝචිත කරුණු පිළිබඳ සැලකිල්ලට ගැනීමේ දී හැර අනවශ්‍ය වන්නා වූ හෝ බාධාකාරී වන්නා වූ හෝ කිසියම් ශබ්දයක් හෝ ශබ්ද ඇති කිරීම;

*(ඈ)* එකී රථ ගාල භාරකරුගේ අවසරයක් නොමැතිව වාහනය නවතා ඇති ස්ථානයක සිට එම රථගාලේම වෙනත් ස්ථානයකට ගෙන ගොස් නැවතීම;

*(ඉ)* එකී රථ ගාලේ ධාවන මං තීරු හෝ ඇතුළුවීමේ හා පිටවීමේ දොරටු අවහිර වන සේ වාහන නවතා තැබීම;

*(ඊ)* අනතුරක් වැළැක්වීම හෝ වාහනයේ හෝ එහි රැඳී සිටින්නන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ හෝ කාර්යය සඳහා හැර යම් වාහනයකට සවි කර ඇති අනතුරු ඇඟවීමේ උපකරණ නාද කිරීම;

*(උ)* ගාල් කර ඇති හෝ එකී රථ ගාලට ඇතළුවන හෝ ඉන් පිටවන කිසියම් වාහනයකට නලාව හැඬවීම;

*(ඌ)* මත්පැන් පානය කිරීම හෝ බුලත් කෙළ ගැසීම හෝ අසභ්‍ය වචන පාවිච්චි කිරීම හෝ කලකෝලාහල කිරීම හෝ සදාචාරාත්මක නොවන ක්‍රියාවක යෙදීම හෝ;
නොකළ යුතු ය.

20. කිසියම් රථ ගාලක නවතා තබන කවර හෝ වාහනයක ආරක්ෂාව පිළිබඳ වගකීම එකී වාහනය රථ ගාල තුළ නවතා තබන තැනැත්තා වෙත තිබිය යුතුවාත් හැර යම් වාහනයකට රථ ගාල ඇතුළත දී සිදුවන කිසියම් අලාභයක් හෝ හානියක් හෝ සම්බන්ධයෙන් නගර සභාව හෝ සභාපතිවරයා හෝ රථ ගාල භාරකරු හෝ වගකීමට යටත් නොවිය යුතු ය.

21. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ රථ ගාල භාරකරු හෝ යම් පොලිස් නිලධාරියෙකු විසින් කිසියම් රථ ගාලක නවතා තිබෙන යම් වාහනයක අයිතිකරුගෙන් *නැතහොත්* රියදුරුගෙන් වාහනය සඳහා නිකුත් කළ ඇතුළුවීමේ අවසර කාඩ්පත පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටි අවස්ථාවක එය පරීක්ෂා කිරීම සඳහා ලබාදීම එකී වාහනයේ අයිතිකරුගේ හෝ රියදුරුගේ කාර්යය විය යුතු ය.

22. 9 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් කිසියම් රථ ගාලක් ඇතුළත පිහිටි ධාවන මංතීරුවක වාහන ධාවනය කළ යුතු දිසාව පෙන්වන සලකුණු කර ඇති දිශාවට පටහැනි දිශාවට කවර හෝ අවස්ථාවක කිසියම් වාහනයක් ධාවනය කිරීම නොකළ යුතු ය.

23. කිසියම් රථ ගාලක කර ඇති යම් ඉදිකිරීමකට හෝ ඒ තුළ පවත්නා යම් උපකරණයකට හෝ හානි කිරීම හෝ විකෘති කිරීම කවර හෝ තැනැත්තකු විසින් නොකළ යුතු ය.

24. නගර සභා ප්‍රදේශය ඇතුළත පිහිටුවා තිබෙන යම් රථගාලක් ඇතුළත නවතා තබන -

*(අ)* රජයේ වාහනවලට ;
*(ආ)* සබරගමුව පළාත් සභාවේ වාහනවලට ;
*(ඇ)* පළාත තුළ සංස්ථාපනය කර ඇති කිසියම් පළාත් පාලන ආයතනයක වාහනවලට ;

මෙම අතුරු ව්‍යවස්ථාවේ 15 ආ සහ 17 වගන්තිවල ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ නොවිය යුතු ය. එසේ වුවද කිසියම් රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක යම් වාහනයකට එකී විධිවිධාන මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල සඳහන් ආකාරයෙන්ම අදාළ විය යුතු ය.

25. කිසියම් රථගාලක ඇතුළු වීමේ අවසර පත්‍රයක් නොමැතිව නවතා තබා ඇති කිසියම් වාහනයක් එකී රථගාලෙන් ඉවත් කිරීමට සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ රථ ගාල භාරකරු හෝ ක්‍රියා කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

26. මේ අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර කිසියම් තැනැත්තෙක් නිසි බලයක් ඇති අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබූ විට 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 (2) වගන්තිය ප්‍රකාරව දඩයක් ද, වරදකරු කිරීමෙන් පසුවද එම කඩකිරීම දිගින් දිගටම කරගෙන යනු ලබයි නම් එකී කඩ කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව එම වරද කරගෙන යන සෑම දිනයක් සඳහාම නගර සභා ආඥා පනතේ 153 (2) වගන්තියේ දක්වා ඇති අතිරේක දඩයකින් යුතු දන්ඩණයක් හා අවසර පත්‍රය අත්හිටුවීමට විධිවිධාන සැලැස්විය හැකි ය.

27. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල.

"බස් නැවතුම්පල" යන්නෙන් ඇඹිලිපිටිය, පල්ලේගම පිහිටි ඇඹිලිපිටිය නගර සභාව සතු මධ්‍යම බස් නැවතුම්පල අදහස් වන්නේ ය.

"මාර්ගය" යන්නෙන් ඇඹිලිපිටිය නගර සභාව සතු කිසියම් මං මාවතක්, මාර්ගයක්, මහා මාර්ගයක්, පටුමගක්, වීථියක්, දෙවැටක්, පඩිපෙළක්, ඒ දණ්ඩක් හෝ මගී පාලමක් අදහස් වන අතර ඇඹිලිපිටිය නගර සභාව සතු කිසියම් මං මාවතකට, මාර්ග යකට, මහා මාර්ගයකට, පටුමගකට, වීථියකට, දෙවැටකට, පඩිපෙළකට සම්බන්ධව සවිකර හෝ සිටුවා ඇති කිසියම් දුර පෙන්වන සලකුණක්, මායිම් ගලක්, මායිම් කණුවක්, පහන් කණුවක්, පාලමක්, කවර හෝ ආකාරයක බෝක්කුවක්, දිය පැන්නුමක්, තාප්පයක්, ආරුක්කුවක්, වේල්ලක්, කාණුවක්, සොරොව්වක්, ආධාරක බැම්මක්, අත්වැලක්, දම්වැලක්, වැටක්, සංඥා පුවරුවක්, මාර්ග නාම පුවරුවක් හෝ මාර්ගයකට යාබද පදික වේදිකාවක් ද ඊට ඇතුළත් විය යුතු ය;

"වාහනය" යන්නෙන්, මෝටර් වාහන පනතේ කිසියම් මෝටර් වාහනයක් සඳහා දෙන ලද අර්ථ නිරූපණයට ගැළපෙන කිසියම් මෝටර් වාහනයක් අදහස් විය යුතු ය.

"සභාව" යන්නෙන් ඇඹිලිපිටිය නගර සභාව අදහස් වන්නේ ය.

"සභාපතිවරයා" යන්නෙන් ඇඹිලිපිටිය නගර සභාවේ සභාපතිවරයා අදහස් වන්නේය.

"බලයලත් නිලධාරියා" යන්නෙන් ඇඹිලිපිටිය නගර සභාවේ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පැවරූ සභාවේ නිලධාරියෙක් අදහස් වන්නේ ය.

28. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

**පළමුවන උපලේඛනය**

**15 වන අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදය**

**ඇඹිලිපිටිය නගර සභාව**

.................................... රථගාල

වාහන නවතා තැබීමේ ගාස්තු

| | |
|---|---|
| ලදුපත් අංකය | :.................................. |
| වාහනයේ අංකය | :.................................. |
| දිනය | : 20.............................. |
| පැමිණි වේලාව | : පෙ.ව./ ප.ව. :................................ |
| පිටවූ වේලාව | : පෙ.ව./ප.ව :.................................. |
| අයකළ ගාස්තුව | : රුපියල් :.................................. |

දෙවන උපලේඛනය

17 වන අතුරු ව්‍යවස්ථාවේ (අ) ඡේදය

කාඩ්පත්‍රයේ ඉදිරිපස

ඇඹිලිපිටිය නගර සභාව

.................................... රථගාල

ඇතුල්වීමේ අවසර කාඩ් පත්‍රය

කාඩ්පත්‍රයේ පිටුපස

මෙම කාඩ් පත්‍රය අන්සතු නොකළ යුතු ය.

රථගාලෙන් පිටවන අවස්ථාවේ දී ආපසු භාරදිය යුතු ය.

09-342

---

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව

පොදු සුසාන භූමි ලෙස භාවිතා කිරීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂිංගික) විධි විධාන පනතේ 2 වගන්තිය සමඟ කියවිය යුතු සුසාන භූමි හා භූමිදාන ආඥා පනතේ 5 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාළව සුසාන භූමි හා මිනීපිටි ආඥා පනතේ 03 වන වගන්තිය යටතේ නිසි බලධාරියා වන ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ නිර්දේශය මත, 1989 අංක 12 දරන පළාත් සභා ආනුෂංගික විධිවිධාන පනතේ 02 වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී ආඥා පනතේ 5 වන වගන්තියෙන්, ගරු විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී තිබූ බලතල සබරගමු පළාත් සභාව විසුරුවා හැරීමත් සමඟ ගරු ආණ්ඩුකාරවරයා වශයෙන් මා වෙත පැවරීමෙන් පසු එම බලතල ප්‍රකාරව මෙහි පහත අංක 01 සිට 10 දක්වා උපලේඛනවල විස්තර කර ඇති ඉඩම් මළවුන් වැළලීම හෝ අදාහනය කිරීම පිණිස වෙන් කරන ලද පොදු සුසාන භූමියක් වශයෙන් භාවිතා කිරීමට නියම කරමි.

නිලූකා ඒකනායක,  
ආණ්ඩුකාරවර,  
සබරගමු පළාත.

2018 අගෝස්තු මස 16 වන දින,  
සබරගමු පළාත් සභාවේ දී ය.

01. උපලේඛනය

| | | |
|---|---|---|
| 01. ඉඩමේ නම | :- | උඩවලව දකුණු ඇළ සුසාන භූමිය |
| 02. ඉඩමේ ප්‍රමාණය | :- | හෙක් : 0.640 |
| 03. ඉඩමේ විස්තරය | :- | මිනුම් පතිගේ සැලසුම් යොමු අංක ර/වි/වලව/89/47P හි දක්වා ඇති කැබලි අංක 179 |
| 04. මායිම් උපලේඛනය | :- | උතුරට - කැබලි අංක 177 |
| | :- | දකුණට - කැබලි අංක 181 |
| | :- | නැගෙනහිරට - කැබලි අංක 178 2/6, 178 3/6, 178 4/6 |
| | :- | බස්නාහිරට - කැබලි අංක 180 |

**02. උපලේඛනය**

| | | |
|---|---|---|
| 01. ඉඩමේ නම | :- | මඩුවන්වෙල සුසාන භූමිය යාය 02 |
| 02. ඉඩමේ ප්‍රමාණය | :- | හෙක් : 0.192 |
| 03. ඉඩමේ විස්තරය | :- | මිනුම්පතිගේ සැලසුම් යොමු අංක ර/වි/වලව/89/47$^{P}$ හි දක්වා ඇති කැබලි අංක 02 |
| 04. මායිම් උපලේඛනය | :- | උතුරට - ගම්මාන පාර |
| | :- | දකුණට - කැබලි අංක 16 |
| | :- | නැගෙනහිරට - කැබලි අංක 03 |
| | :- | බස්නාහිරට - ගම්මාන පාර හා කැබලි අංක 18 |

**03. උපලේඛනය**

| | | |
|---|---|---|
| 01. ඉඩමේ නම | :- | තුංකම සුසාන භූමිය |
| 02. ඉඩමේ ප්‍රමාණය | :- | හෙක් : 0.100 |
| 03. ඉඩමේ විස්තරය | :- | මිනුම්පතිගේ සැලසුම් යොමු අංක ISPP$^{P}$ හි දක්වා ඇති කැබලි අංක 734 |
| 04. මායිම් උපලේඛනය | :- | උතුරට - කැබලි අංක 722 ප්‍රවේශ මාර්ගය |
| | :- | දකුණට - කැබලි අංක 734 ඉතිරි කොටස |
| | :- | නැගෙනහිරට - කැබලි අංක 734 ඉතිරි කොටස |
| | :- | බස්නාහිරට - කැබලි අංක 734 ඉතිරි කොටස |

**04. උපලේඛනය**

| | | |
|---|---|---|
| 01. ඉඩමේ නම | :- | මලබොටුආර සුසාන භූමිය |
| 02. ඉඩමේ ප්‍රමාණය | :- | හෙක් : 0.815 |
| 03. ඉඩමේ විස්තරය | :- | මිනුම්පතිගේ සැලසුම් යොමු අංක ර/වි/වලව/89-67$^{P}$ හි දක්වා ඇති කැබලි අංක 78 |
| 04. මායිම් උපලේඛනය | :- | උතුරට - මලබොටුආර රක්ෂිතය |
| | :- | දකුණට - කැබලි අංක 74, 76, 77 |
| | :- | නැගෙනහිරට - ගම්මාන පාර |
| | :- | බස්නාහිරට - කැබලි අංක 7 |

**05. උපලේඛනය**

| | | |
|---|---|---|
| 01. ඉඩමේ නම | :- | මුදුන්මංකඩ සුසාන භූමිය |
| 02. ඉඩමේ ප්‍රමාණය | :- | හෙක් : 0.920 |
| 03. ඉඩමේ විස්තරය | :- | මිනුම්පතිගේ සැලසුම් යොමු අංක 89-40$^{P}$ හි දක්වා ඇති කැබලි අංක 288 |
| 04. මායිම් උපලේඛනය | :- | උතුරට - කැබලි අංක 287 1/2, 287 2/2 |
| | :- | දකුණට - ගම්මාන පාර |
| | :- | නැගෙනහිරට - ගම්මාන පාර කැබලි අංක 287 1/2,287 2/2 |
| | :- | බස්නාහිරට - කැබලි අංක 289, 290, 291 |

**06. උපලේඛනය**

| | | |
|---|---|---|
| 01. ඉඩමේ නම | :- | උඩවලව CDE පෙදෙස සුසාන භූමිය |
| 02. ඉඩමේ ප්‍රමාණය | :- | හෙක් : 0.696 |
| 03. ඉඩමේ විස්තරය | :- | මිනුම්පතිගේ සැලසුම් යොමු අංක ර/වලව/90-142$^{-PC}$ හි දක්වා ඇති කැබලි අංක 49 |
| 04. මායිම් උපලේඛනය | :- | උතුරට - ගඟ රක්ෂිතය හා කැබලි අංක 48 |
| | :- | දකුණට - ගම්මාන පාර |
| | :- | නැගෙනහිරට - ගඟ රක්ෂිතය |
| | :- | බස්නාහිරට - ගම්මාන පාර |

### 07. උපලේඛනය

| | | |
|---|---|---|
| 01. ඉඩමේ නම | :- | ගඟේයාය සුසාන භූමිය |
| 02. ඉඩමේ ප්‍රමාණය | :- | හෙක් : 0.780 |
| 03. ඉඩමේ විස්තරය | :- | මිනුම්පතිගේ සැලසුම් යොමු අංක ර/128 හි දක්වා ඇති කැබලි අංක 179 |
| 04. මායිම් උපලේඛනය | :- | උතුරට - කැබලි අංක 163 |
| | :- | දකුණට - ගම්මාන පාර |
| | :- | නැගෙනහිරට - ගම්මාන පාර |
| | :- | බස්නාහිරට - කැබලි අංක 180 |

### 08. උපලේඛනය

| | | |
|---|---|---|
| 01. ඉඩමේ නම | :- | කුට්ටිගල පදලංගල සුසාන භූමිය |
| 02. ඉඩමේ ප්‍රමාණය | :- | අංක. 01 |
| 03. ඉඩමේ විස්තරය | :- | මිනුම්පතිගේ සැලසුම් යොමු අංක ISSP - 1 හි දක්වා ඇති කැබලි අංක 1312 |
| 04. මායිම් උපලේඛනය | :- | උතුරට - කැබලි අංක 1312න් කොටසක් |
| | :- | දකුණට - කැබලි අංක 1312න් කොටසක් |
| | :- | නැගෙනහිරට - ඌරුපැරැත්ත මාර්ගය |
| | :- | බස්නාහිරට - කැබලි අංක 1312න් කොටසක් |

### 09. උපලේඛනය

| | | |
|---|---|---|
| 01. ඉඩමේ නම | :- | බොගල්ආර ජයතිමාපියපුර සුසාන භූමිය |
| 02. ඉඩමේ ප්‍රමාණය | :- | අක්. 01 |
| 03. ඉඩමේ විස්තරය | :- | මිනින්දෝරු සැලසුම් යොමු අංක වා.මැමු.පි. 1 හි දක්වා ඇති කැබලි අංක 3176 |
| 04. මායිම් උපලේඛනය | :- | උතුරට - කැබලි අංක 2713 කුට්ටිගල උස්වැව වන රක්ෂිතය |
| | :- | දකුණට - කැබලි අංක 3179, 3178 නිවාස කැබලි කොටස් |
| | :- | නැගෙනහිරට - කැබලි අංක 3171 ජනපද වගා රක්ෂිතය |
| | :- | බස්නාහිරට - කැබලි අංක 3175, 3178 නිවාස කැබලි කොටස් |

### 10. උපලේඛනය

| | | |
|---|---|---|
| 01. ඉඩමේ නම | :- | ලියන්ගස්තොට සුසාන භූමිය |
| 02. ඉඩමේ ප්‍රමාණය | :- | අක්. 1 1/2 |
| 03. ඉඩමේ විස්තරය | :- | සැලසුම් යොමු අංක I. S. P P-1 හි දක්වා ඇති කැබලි අංක 803 |
| 04. මායිම් උපලේඛනය | :- | උතුරට - කැබලි අංක 806, 807 ක කැබලි කොටස් |
| | :- | දකුණට - කැබලි අංක 720D 22 ඇළ මාර්ග රක්ෂිතය |
| | :- | නැගෙනහිරට - කැබලි අංක 807 කැබලි කොටස් හා 622 1/2 කෙත් ඇළ |
| | :- | බස්නාහිරට - කැබලි අංක 805 කෙත් ඇළ වගා රක්ෂිතය |

09-343

---

## දැරණියගල ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 සහ 24 (2) වැනි වගන්තිය යටතේ කරන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දැරණියගල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත දැරණියගල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් දක්වා ඇති මංමාවත් සම්බන්ධයෙන් අදාළ ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් විරුද්ධතාවයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනයේ සිට එක් මසක් ඇතුළත එම විරෝධතාවයන් ලිඛිතව දැරණියගල ප්‍රාදේශීය

සභාවේ සභාපති වෙත ලේඛනගත තැපෑලෙන් එවන ලෙස 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ. බී. ඩබ්. ලක්ෂ්මන් රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2018 අගෝස්තු මස 27 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ගුරුකඩේහේන නොහොත් ගුරුගොඩ වත්ත නැමති මාර්ගය**

| *ග්‍රාම නිළධාරී කොට්ඨාසය* | *පාරේ අංකය* | *පාරේ නම* | *දුර කි. මී.* | *පළල අඩි* | *පාරේ තත්වය* | *පාර විහිදී යන ඉඩම්වල විස්තර* |
|---|---|---|---|---|---|---|
| දැරණියගල වසම 114ඩී | 1 | ගුරුකඩේහේන නොහොත් ගුරුගොඩ වත්ත නැමති මාර්ගය (දැරණියගල දෙහිඕවිට ප්‍රධාන පාරේ කොල්පිටින් හන්දියේ සිට මීටර් 40ක් පමණ දැරණියගල දෙසට වන ස්ථානයේ සිට කේ. අතුල මහතාට අයත් ඉඩම දක්වා) | මීටර් 150 | මාර්ගය ආරම්භයේ සිට අඩි 330ක් දිගට මාර්ගයේ පළල අඩි 10 ලෙසත් ඉන් ඉදිරියට ඉතිරි අඩි 170ක මාර්ග කොටස අඩි 8 පළල වේ. | වාහන ගමන් කරන පොදු මාර්ගය | පාරේ දකුණු පස : එස්. කරුණාරත්න මහතාට අයත් ගුරුකඩේහේන නොහොත් ගුරුගොඩ වත්ත නැමති ඉඩම් කොටස, එම්. එල්. පුංචි මහත්තයාට අයත් ගුරුකඩේහේන නොහොත් ගුරුගොඩවත්ත නැමති ඉඩම, ඩී. ජී. එම්. පී. බණ්ඩාර මහතාට අයත් ගුරුකඩේහේන නොහොත් ගුරුගොඩ වත්ත නැමති ඉඩම් කොටස, යූ. ජී. පියරත්න මහතාට අයත් ගුරුකඩේහේන නොහොත් ගුරුගොඩ වත්ත නැමති ඉඩම් කොටස, කේ. අතුල මහතාට අයත් ගුරුකඩේහේන නොහොත් ගුරුගොඩ වත්ත නැමති ඉඩම් කොටස,<br><br>පාරේ වම් පස : එම්. එල්. පුංචිමහත්තයාට අයත් ගුරුකඩේහේන නොහොත් ගුරුගොඩ වත්ත නැමති ඉඩම, එල්. එම්. ගයානි නවරත්න මහත්මියට අයත් ගුරුකඩේහේන නොහොත් ගුරුගොඩ වත්ත නැමති ඉඩම් කොටස, ඩබ්. ඒ. ජී. කේ. වික්‍රම ආරච්චි මහතාට අයත් ගුරුකඩේහේන නොහොත් ගුරුගොඩ වත්ත නැමති ඉඩම් කොටස |

09-355

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛණයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාල ඉඩම්වල හිමිකරුවන් ලෙස අයත් ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පල වූ දිනයේ සිට එක් මාසයක් ඇතුලත තමන්ගේ අයිතිය නිවේදනය කිරීම ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 24 (02) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

02. මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් උපලේඛණයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. ගාමිණී තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

### ලියාපදිංචි කළ යුතු මාර්ගය


| *අනු. අංකය* | *ග්‍රාම නිලධාරී වසම* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස පදිංචිකරුවන්* | *දකුණු පස පදිංචිකරුවන්* | *දිග (මීටර්)* | *පළල (අඩි)* |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | අංක 26- නිව් පේරාදෙණිය වසම | ගෙලිඔය- වත්ත පළවෙනි පටුමග | වැත්තෑවවත්ත නිව් පේරාදෙණිය පොදු සුසාන භූමිය දෙසට යන පාර | යූ. පී. අල්විස් මයාගේ නිවස අසල | 1. අබේසිංහ මාලියද්ද මයා, ආර්. කේ. පී. මාලියද්ද මයා, අංක 356/1/ඊ, ප්‍රාදේශීය සභාව පාර, ගෙලිඔය, ගෙලිඔයවත්ත ඉඩම<br>2. ජේ. ජේ. පොඩිමැණිකේ මිය, අංක 16/1, ගෙලිඔයවත්ත, ගෙලිඔය.<br>3. ඩබ්. එස්. වී. එම්. යූ. ප්‍රසාදනී අල්විස් මිය | 2. එච්. එල්. මොහොමඩ් නවිෆර් මයා, අංක 14/1, ගෙලිඔයවත්ත,ගෙලිඔය.<br>3. එම්. එල්. මොහොමඩ් මයා, අංක 22/1, ගෙලිඔයවත්ත, ගෙලිඔය.<br>4. එම්. එච්. අබුල් හසන් මයා, අංක 15, ගෙලිඔයවත්ත, ගෙලිඔය.<br>5. ඩී. රත්නවදනා මිය, අංක 16/4, ගෙලිඔයවත්ත, ගෙලිඔය.<br>6. එම්. එල්. එස්. මර්ලියා මිය, අංක 14, ගෙලිඔයවත්ත, ගෙලිඔය.<br>7. ඩබ්.එස්. වී. එම්. අමරවංශ මයා, අංක1, ගෙලිඔයවත්ත, ගෙලිඔය.<br>3. ඒ. ෆාතිමා මිය, අංක 14/3, ගෙලිඔයවත්ත, ගෙලිඔය.<br>ගෙලිඔයවත්ත ඉඩම | අඩි 325 | අඩි 08 |

| *අනු. අංකය* | *ග්‍රාම නිලධාරී වසම* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස පදිංචිකරුවන්* | *දකුණු පස පදිංචිකරුවන්* | *දිග (මීටර්)* | *පළල (අඩි)* |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | අංක 43- පිටවලවත්ත | නරවිල- වත්ත මාර්ගය | වෙන්දේසි වත්තේ සිට | නරවිල කුඹුර | 1. එච්. ඩී. ජී. ඉලං- ගරත්න මයා<br>2. කේ. ජී. ජයසූරිය මයා<br>3. එච්. ජී. ධර්මරත්න මයා | 1. එල්. එල්. ජී. විජේසිංහ මයා- නරවිලවත්ත ඉඩම<br>2. ඩබ්. ජී. සුගතපාල මයා<br>3. ඩබ්. ජී. සුසන්ත මයා | මීටර් 500 | 10 |

ටී. එම්. ගාමිණී තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

M.K.S.M.M.Dissanayake
Registered Licd. Surveyor & Leveller
Court Commissioner
Gelioya
T.P.No 072-4606148

PLAN No.1024




Scale - 1:1000

## — PLAN —

of Land called Portion of "Gelioya Watta" and "Coorunduwatta Estate"
Situated at Karamada Village (New Peradeniya Wasama No 26)
in Kandukaru Pahala Korale of Udunuwara D.S.Division
KANDY DISTRICT

## CENTRAL PROVINCE


Being a Re-Survey of part of lot 1 in Plan No P.P.Maha 3033
made by Surveyor General

| Lot No. | Extent | | | | Remarks |
|---|---|---|---|---|---|
| | Hect. | A. | R. | P. | |
| 1 | 0.0334 | 0 | 0 | 13.21 | Road [illegible] |

Surveyed on 05.08.2018
[signature]
M.K.S.M.M. Dissanayake
Registered Licensed Surveyor
Court Commissioner
Reg. No. 20041057
2018.08.11

P. Indrani Mallika
Registered Licensed Surveyor
Reg. No. 19900296
2nd Mile Post,
Heeyawala,
Handessa.

PLAN No: 2302




Scale 1:1000

# PLAN

OF

Being a Portion of Road

Situated at

G.N.Division No. 43, Pitawalawatta

Dehipagoda Village

Within the Pradeshiya Sabha limits of Udunuwara

in Gangapalathe Korale of Udunuwara D.S.Division

KANDY DISTRICT

CENTRAL PROVINCE

Containing in Extent

| Lot No | Extent | | | | Remarks |
|---|---|---|---|---|---|
| | Hec | A. | R. | P. | |
| 1 | 0.0442 | 0 | 0 | 17.50 | Road (10 Feet width) |
| Total | 0.0442 | 0 | 0 | 17.50 | |

Length of "A" to "B" = 143.6 m (470 Feet)

Boundaries pointed out by owners of the land in both side of road.

Surveyed on 31st of August 2015.

P. INDRANI MALLIKA
Registered Licence Surveyor
2nd Mile Post
Heeyawala, Handessa
081-2...661

09-231

# විවිධ දැන්වීම්

## වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව

### 01. කීරිමලයි සංචාරක කේන්ද්‍රස්ථානයේ පිහිටියා වූ පොකුණෙහි දිය නෑමට අයකළ හැකි ගාස්තු - 2018

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පවිත්‍රතාවය සහ සෞඛ්‍යය ආරක්‍ෂා කිරීමේ අරමුණින් වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ සීමාව තුළ පිහිටියා වූ සංචාරක කේන්ද්‍රස්ථානය වන කීරිමලයි පොකුණෙහි දිය නෑම පිණිස පහත දක්වෙන පරිදි ගාස්තු අය කිරීමටත්, පාසැල් සිසුන් ප්‍රාදේශීය සභාව වෙතින් පූර්වාංග අනුමැතිය ලබා ගතයුතු බවත්, ජූලි මස අමාවක හා සිවරාත්‍රි දිනවලට නොමිළේ දිය නෑම අනුමත කරන බවත් අංක 13/17.05.2018 දරන සභා තීරණයට අනුව තීරණය කර ඇති බව දන්වමි.

| | | |
|---|---|---|
| වැඩිහිටි පුද්ගලයෙකු සඳහා | - | රු. 20 0 |
| බාලවයස්කාර පුද්ගලයෙකු සඳහා | - | රු. 10 0 |

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලට්ඩි).

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලට්ඩි).

09-229/1

---

## වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව

### 02. හින්දු සුසානභූමිවල මෘතදේහ ආදහන කිරීමට ගාස්තු අයකිරීම - 2018

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පවිත්‍රතාවය සහ සෞඛ්‍යය ආරක්‍ෂා කිරීමේ අරමුණින් ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තිය සමග කියවිය යුතු 126 (iv) (ඇ) සහ (ix) (ඒ) වැනි වගන්ති යටතේ සුසානභූමි හා මිනීපිටි ආඥාපනත යටතේ ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇත්තා වූ බලතල ප්‍රකාරව, වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ අංක 26/11.04.2018 දරන සභා තීරණයට අනුව වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවට ඇතුළත් හින්දු සුසානභූමිවල මෘතදේහ ආදහන කිරීමට හෝ මිහිදන් කිරීමට හෝ සතුන් වැළලීමට ගාස්තු වශයෙන් එක් මෘත දේහයකට හෝ එක් සත්වයෙකුට රුපියල් 1000.00 ක් බැගින් අය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලට්ඩි).

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලට්ඩි).

09-229/2

## වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව

03. පොදු දක්ම ශාලාව කුලියට දීම - 2018

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පවිත්‍රතාවය සහ සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ අරමුණින් වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ සීමාව තුළ කුරුම්පසිට්ඩි ප්‍රදේශයේ පිහිටියා වූ සභාවට අයිති පොදු දක්ම ශාලාවෙහි කුලී ගාස්තු පහත දක්වෙන පරිදි අයකරනු ලබන බව අංක 05/11.04.2018 දරන සභා තීරණයට අනුව තීරණය කර ඇති බව දන්වමි.

| | | | |
|---|---|---|---|
| 1. | සමාජ සේවා සංවිධානයක් සඳහා එක් දවසකට<br>(පැය 08ක්) පාවිච්චි කිරීමේ ගාස්තුව.<br>(විදුලි ගාස්තුව රු. 400.00ක් ඇතුළත්ව) | - | රු. 2,400 0 |
| 2. | සමාජ සේවා සංවිධානයක් සඳහා අඩ දවසකට<br>(පැය 04ක්) පාවිච්චි කිරීමේ ගාස්තුව<br>(විදුලි ගාස්තුව රු. 200 ක් ඇතුළත්ව) | - | රු. 1,200 0 |
| 3. | මහජන මංගල උත්සවයක් පැවැත්වීම සඳහා එක්<br>දවසකට (පැය 08ක්) පාවිච්චි කිරීමේ ගාස්තුව | - | රු. 5,000 0 |
| 4. | මහජන මංගල උත්සවයක් පැවැත්වීම සඳහා - අඩ දවසකට<br>(පැය 04ක්) පාවිච්චි කිරීමේ ගාස්තුව | - | රු. 3,000 0 |

5. රාජ්‍ය ආයතන හා පාසල් ගාස්තු අයකිරීමෙන් තොරව ශාලාව පාවිච්චි කළ හැකිය.
විදුලි ගාස්තුව එක් දවසකට රු. 400 යි. අඩ දවසකට රු. 200.00 යි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලට්ඩි).

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලට්ඩි).

09-229/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.